**ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - 2018**
**----------------------------------------------**

**1.1. මතය**

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි ("බැංකුව") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

බැංකුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**කරුණක් අවධාරණය**

මාගේ මතය තත්වාගණනය නොකරමින්, මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 22.2 කෙරෙහි ඔබේ අවධානය යොමු කරන අතර 2016 වසරේ රජයේ අයවැය යෝජනා අනුව බැංකුව විසින් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ සියයට සියයක් කොටස් අත්පත් කර ගෙන ඇති බවත්, එමඟින් ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ ඒකාබද්ධ කිරීමට යෝජනා කර ඇති බවත් එහි සඳහන් වේ. ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ සමස්ත කොටස් අයිතිය රු.බිලියන 4.176 ක ගැනුම් ප්‍රතිෂ්ටාවකට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් අත්පත් කරගත් අතර, 2018 දෙසැම්බර් 31 දිනට බලපැවැත්වෙන පරිදි මහා භාණ්ඩාගාරයට පක්ෂව නව කොටස් නිකුතුවක් මඟින් ගැනුම් ප්‍රතිෂ්ටාව පියවන ලදි. කෙසේ වෙතත්, කොටස් අවලංගු කිරීම හෝ නව කොටස් නිකුත් කිරීම ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ පොත් වලට ගෙන නොතිබූ අතර, 2018 දෙසැම්බර් 31 දිනට කොටස් හිමියන්ගේ මුළු අරමුදල් රු.බිලියන 5.386 ක් විය. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තහවුරු කළ පරිදි පාලන බලය මුදල් අමාත්‍යාංශය සතු වූ බැවින් ඉහත ආයෝජනය ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පරිපාලිත සමාගමක් වීමට සුදුසුකම් නොලබයි.

**1.2. මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**ප්‍රධාන විගණන කරුණු**
මූල්‍ය ප්‍රකාශන විගණනයේදී මාගේ වෘත්තීය විනිශ්චය අනුව ප්‍රවර්තන කාල පරිච්ඡේදය සඳහා වඩාත් වැදගත් කරුණු ප්‍රධාන විගණන කරුණු වේ. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ විගණන මතය ගොඩනැගීමේදී විගණනයේදී මෙම කරුණු සමස්තයක් ලෙස සලකා බැලූ අතර මෙම කරුණු පිළිබඳ වෙන් වෙන්ව මතයක් මා විසින් ප්‍රකාශ කරනු නොලැබේ.

**ප්‍රධාන විගණන කාරණය**

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 වෙත බැංකුවේ මාරුවීම ඇතුළුව ණය සහ අත්තිකාරම් සඳහා හානිකරණ දීමනාව:
අනෙකුත් ගනුදෙණුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු දේ සඳහා වන හානිකරණ දීමනාව ප්‍රධාන විගණන කරුණක් ලෙස මාගේ විගණනයේදී සලකන ලදී.ණය සහ අත්තිකාරම් ලෙස වාර්තාගත අගයන්ගේ ප්‍රමාණාත්මකභාවය (සහ ඒ සඳහා වූ හානිකරණ දීමනාව), කළමනාකරණය විසින් සිදු කරන ලද හානිකරණ ඇස්තමේන්තුවල විෂයගතභාවය සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 වෙත සංක්‍රමණය වීම, (ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9) එය ප්‍රධාන විගණන කරුණක් ලෙස සැලකීම සඳහා වූ මාගේ පදනම තහවුරු කරන ලදී.

2018 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු වත්කම් වලින් සියයට 75 ප්‍රතිශතයක් අනෙකුත් ගනුදෙණුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු දෑ වටිනාකම රු.මිලියන 133,433 (සටහන 20) වූ අතර ශුද්ධ හානිකරණ දීමනාව රු.මිලියන1,410 (සටහන10) විය. ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9 වෙත මාරුවීමේදී බැංකුවේ මූල්‍ය ප්‍රකාශන මත වූ බලපෑම මූල්‍ය ප්‍රකාශන සටහන 4 හි දක්වා ඇත.

වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු දේ සඳහා වන හානිකරණ දීමනාව තක්සේරු කිරීම සංකීර්ණ හස්තමය ගණනය කිරීම මඟින් සිදුකර තිබුණි.
එම ගණනය කිරීම සඳහා කළමනාකරණය විසින් යොදාගත් සැලකිය යුතු ඇස්තමේන්තු සහ උපකල්පන, ඒවායේ සංවේදීභාවය සහ හානිකරණ දීමනාව සඳහා පදනම සටහන 3.1.1.7 හි දක්වා ඇත.

**මාගේ විගණනයේදී ප්‍රධාන විගණන කරුණ ආමන්ත්‍රණය කරන ලද ආකාරය**

හානිකරණ දීමනාවේ සාධාරණභාවය තක්සේරු කිරීම සඳහා, ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා නිර්මාණය කරන ලද මාගේ විගණන ක්‍රියාපටිපාටි අතර, පහත සඳහන් දෑ ද ඇතුළත් විය:

- අනෙකුත් ගනුදෙණුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු දෑ සඳහා වන හානිකරණ දීමනාව ඇස්තමේන්තු කිරීම පිළිබඳ වූ පාලනයන් නිර්මාණය, ක්‍රියාත්මක කිරීම හා මෙහෙයුම් ඵලදායකත්වය, දෝෂයන්ගේ ප්‍රමාණය තක්සේරු කිරීම සමාලෝචනය සහ හානිකරණ ප්‍රතිපත්ති විගණන හා කළමනාකරණ කමිටුව විසින් අනුමත කිරීමද ඇතුළත්ව මා විසින් ඇගයීමට ලක් කරන ලදී.
- පාදක වූ ගණනය කිරීම් සහ දත්ත සෝදිසි පරීක්ෂාවට භාජනය කරන ලදී.
- ඉහත සඳහන් කරුණු වලට අමතරව, පහත දැක්වෙන කේන්ද්‍රගත ක්‍රියාපටිපාටින් ක්‍රියාත්මක කරන ලදී:

  අනෙකුත් ගනුදෙණුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු දෑ සඳහා - හානිකරණය සඳහා වෙන් වෙන්ව ඇගයීම

  - හානිකරණ සිදුවීමක් සිදුවී ඇත්දැයි තීරණය කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් භාවිතා කරන ලද ප්‍රධාන නිර්ණායක මා විසින් තක්සේරු කරන ලදී.
  - හානිකරණ දර්ශක පවත්නා අවස්ථාවන්හිදී අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන්ද, වට්ටම් අනුපාත සහ සුරකුම් වල වටිනාකම අගය කිරීම මා විසින් තක්සේරු කරන ලදී. අනාගත අයකර ගැනීම් පිළිබඳව ඉකුත් වර්ෂවල කරන ලද ඇස්තමේන්තු අගයන් සහ සත්‍ය අයකර ගැනීම් මා විසින් සසඳා බලන ලදී.
  - ණය අය කර ගැනීමේ ඉහළ අවදානමක් ඇති ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් ලබා දී ඇති විට, හානිකරණ අවස්ථාවක් පැනනැඟීමට ඇති ඉඩකඩ තීරණය කිරීම සම්බන්ධයෙන් කළමනාකාරිත්වය විසින් භාවිතා කරන ලද ප්‍රධාන නිර්ණායකයන් සහ එවැනි අතිරේක හානිකරණ සම්බන්ධයෙන් කළමනාකරණ ඇස්තමේන්තුවල සාධාරණභාවය මා විසින් තක්සේරු කරන ලදී.

අනෙකුත් ගනුදෙණුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු දැ සඳහා - හානිකරණය සඳහා සමස්තයක් ලෙස තක්සේරු කිරීම

- බැංකුවේ මූලාශ්‍ර ලේඛන සහ තොරතුරු තාක්ෂණ පද්ධතිවල තොරතුරු වලට එකඟ වීම සහ හානිකරණ දීමනාව නැවත ගණනය කිරීම මඟින් හානිකරණ ගණනය කිරීම් සඳහා භාවිතා කරන ණය සහ ලැබිය යුතු දැ සම්බන්ධයෙන් පාදක වූ තොරතුරු වල සම්පූර්ණභාවය, අදාළත්වය සහ නිරවද්‍යතාවය මා විසින් පරීක්ෂා කරන ලදී.
- විවිධ වර්ගයේ ණය සඳහා කළමනාකරණය විසින් ඔවුන්ගේ විනිශ්චයන්ට අනුව භාවිතා කරන ලද සාර්ව ආර්ථික සහ අනෙකුත් සාධකවල සාධාරණභාවය ප්‍රසිද්ධ දත්ත සහ තොරතුරු මූලාශ්‍ර සමඟ සසඳමින් මා විසින් සළකා බලන ලදී.

- සටහන 20 හි දක්වා ඇති පරිදි අදාළ මූල්‍ය ප්‍රකාශන හෙළිදරව් කිරීම්වල ප්‍රමාණවත්භාවයද මා විසින් තක්සේරු කරන ලදී.
- සටහන 4 හි දක්වා ඇති පරිදි ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9 යොදා ගැනීමේ මූලික බලපෑම සම්බන්ධයෙන් බැංකුවේ හෙළිදරව් කිරීම්වල ප්‍රමාණවත්භාවයද මා විසින් තක්සේරු කරන ලදී. සංක්‍රමණයේ ප්‍රමාණාත්මක බලපෑම පිළිබඳ පරීක්ෂා මෙයට ඇතුළත් වේ.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය බැංකුව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා බැංකුවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, බැංකුව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5. මූල්‍ය ප්‍රකාශන

### 1.5.1. නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොදු ලෙජර ශේෂය සහ 2018 දෙසැම්බර් 31 දින වන විට ලැබී නොමැති ස්වශක්ති ප්‍රදාන ලැයිස්තුව අතර රු.4,956,106 ක වෙනසක් නිරීක්ෂණය විය. | ප්‍රතිමූල්‍ය ලැබීම් හා ශාඛා විසින් කරන ලද ප්‍රතිපාදන අතර වෙනස ශේෂය මඟින් පෙන්නුම් කරන අතර බැංකුවේ ණය අංශයෙහි උපදෙස් සමඟ මෙම කරුණ නිරාකරණය කිරීමට කටයුතු කරනු ලැබේ. | වෙනස සැසඳීම සඳහා අවශ්‍ය පියවර ගැනීම . |

## 1.6. ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1. ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) "අතට පොලිය" යෝජනා ක්‍රමය යටතේ ස්ථාවර තැන්පතු සඳහා පොලිය තැන්පතුව ආරම්භයේදීම පාරිභෝගිකයාට ගෙවනු ලැබේ. ගෙවූ පොලිය කලින් ගෙවූ පොලී ආදායම් ගිණුමට හර කරනු ලබන අතර මාසික පොලිය පද්ධතිය විසින් ස්වයංක්‍රීයව ගණනය කරනු ලැබේ. | | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කලින් ගෙවූ පොලී ආදායම් ගිණුමේ සහ ගෙවිය යුතු පොලී ආදායම් ගිණුමේ අදාළ ශේෂයන් හිලව් කිරීම අවශ්‍ය වේ. |
| (අ) කෙසේ වෙතත්, 2018 වර්ෂයට අදාළව රු.2,725,087 ක් වූ පෙරගෙවුම් පොලී, ගෙවිය යුතු පොලී ගිණුමට මාරු කර නොමැති අතර එහෙයින් 2018 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් රු. 2,725,087 කින් වැඩියෙන් දක්වා තිබුණි. | පොලී පෙරගෙවුම් ශේෂයන් වහාම පියවා ගැනීම සඳහා උපදෙස් ලබා දී ඇත . | |

| | | |
|---|---|---|
| (ආ) 2018 හි අලුතින් විවෘත කරන ලද වටිනාකම රු.49,644,312 ක් වූ ගිණුම් සඳහා "අතට පොලිය" තැන්පතු පෙරගෙවුම් පොලී මුදල රු.5,271,967 වුවද, 2018 දෙසැම්බර් 31 දිනට පෙරගෙවුම් තැන්පතු පොලී ගිණුමේ ශේෂය රු. 10,422,864 ක් වූ අතර, රු. 5,150,897 ක වෙනසක් නිරීක්ෂණය විය. | අළුත් කිරීමේදී පොලී ගෙවීමකින් තොරව අතට පොලී වලට අදාල පොලී අනුපාතය යෙදීමෙන් ස්වයංක්‍රීයව අලුත් කිරීම සිදුවී ඇත . කෙසේ වෙතත්, " අතට පොලී " චක්‍රලේඛ උපදෙස් ඒ අනුව සංශෝධනය කළ යුතුය. | |

### 1.6.2. ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) පෙර වසර හා සසඳන විට රු.මිලියන 112.2 ක ප්‍රතිමූල්‍ය ගෙවිය යුතු ශේෂයන් වෙනසකින් තොරව පැවති අතර එම ශේෂයන් ඉවත් කිරීමට පියවර ගෙන නොතිබුණි. | මෙම ශේෂයන් බොහොමයක් එම්බීවින්(MBwin) පද්ධතියේ සිට මධ්‍යගත බැංකු පද්ධතිය (Core Banking System) දක්වා දත්ත සංක්‍රමණය කිරීමේ ක්‍රියාවලියේදී සටහන් කර ඇති අතර දිගු කාලීන ගෙවිය යුතු ශේෂයන් ඉවත් කිරීමට උපදෙස් යවා ඇත. ඉහත කරුණු වත්කම් හා වගකීම් කමිටු රැස්වීමේදී සාකච්ඡා කෙරිණි. | ගෙවිය යුතු ශේෂයන් පියවීමෙන් පසු ක්‍රියාත්මක නොවන ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම වසා දැමීමට අවශ්‍ය පියවර ගන්න. |
| (ii) 2002 සිට මහවැලි අධිකාරියෙන් ලබාගත් අරමුදල් 02 ක් සඳහා පොලිය අඛණ්ඩව උපචිත කර තිබුණද, 2018 දෙසැම්බර් 31 දක්වා කිසිදු පොලියක් ගෙවීමට බැංකුව පියවර ගෙන නොතිබුණි. 2018 දෙසැම්බර් 31 වන විට උපචිත පොලිය රු.40,194,150 ක් වූ අතර ඉන් රු.36,764,636 ක් 2017 දෙසැම්බර් 31 දිනට ද පැවතිණි. ගිවිසුමේ වගන්ති අංක 04 අනුව, බැංකුව ගොවි සංවිධාන සඳහා ණය දීමෙන් වසරකට සියයට 12 පොලී ආදායමක් උපයා ගැනීමට අවස්ථාවක් තිබුණි. මහවැලි අධිකාරිය සමඟ එකඟ වූ පරිදි ඉහත අරමුදල් භාවිතා කළ බවට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවිය. | ණය යෝජනා ක්‍රම දෙකක් ක්‍රියාත්මක කිරීමට මහවැලි අධිකාරිය එකඟ වී තිබුණි. කෙසේ වෙතත්, මහවැලි අධිකාරිය පසුව මෙම යෝජනා ක්‍රම අත්හිටුවීමට තීරණය කර ඇති අතර වෙන් කළ අරමුදල් ආපසු ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි. එබැවින් මේ සම්බන්ධයෙන් ඉදිරියට ගන්නා ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් වත්කම් හා වගකීම් කමිටුවේ අනුමැතිය ඉල්ලා තිබේ. | ප්‍රතිමූල්‍ය ණය ශේෂය සඳහා උපචිත පොලිය අදාළ ආයතනවලට ගෙවීමට අවශ්‍ය පියවර ගන්න. |

| | | |
|---|---|---|
| (iii) "UNDP-RUEDA ඇපකර අරමුදල" මත ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය රු.34,124,900 අරමුදලකින් 2009 දී ආරම්භ කර තිබූ අතර, 2013 දෙසැම්බර් සිට ඉහත යෝජනා ක්‍රමය ක්‍රියාත්මක නොවීය. කෙසේ වෙතත්, බැංකුව විසින් ඉහත අරමුදල් ආපසු ලබා දීමට පියවර ගෙන නොමැති අතර එය රටට අනාගත ප්‍රතිලාභ සීමා කිරීමට හේතු විය හැක. තවද, වැල් පොලී මත පවත්නා පොලී අනුපාතයට මාසිකව පොලිය උපචිත කර ඇති අතර, 2018 දෙසැම්බර් 31 දිනට බැංකුවට රු. 11,003,743 ප්‍රාග්ධනයක් හා රු.23,417,695 පොලියක් ගෙවිය යුතුව පවතී. | UNDP සහ RUEDA සමඟ පැවති රැස්වීමේදී UNDP වෙත මුදල් ආපසු නොගෙවීමට තීරණය කරන ලදී. කෙසේ වෙතත්, ලිඛිත සාක්ෂි නොමැත. එබැවින් බැංකුව අරමුදල හෝ පොලිය UNDP වෙත ආපසු ලබා දී නොමැත. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ශේෂය පියවා දැමීම හෝ අදාළ පාර්ශ්වයන් සමඟ එකඟතාවයකට පැමිණීමට ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. |
| (iv) ණය ඇපකර වන්දි ශේෂයේ සංයුතිය, ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලැබුණු සහ ගෙවන ලද ණය ඇපකර මුදල සහ අයකර ගත් වාරික මුදල් පිළිබඳ විස්තර ලබා ගත නොහැක. 2015 සිට 2019 මාර්තු දක්වා වාරික අයකර නොගැනීම් හේතුවෙන් CG 1 සහ CG 2 ආපසු ගෙවීම් ලෙස මහ බැංකුවට රු. 25,371,311 ක් ගෙවා ඇත. | විධායක ණය කමිටුවේදී ගැටළුව සාකච්ඡා කළ අතර තත්වය වැළැක්විය නොහැකිය. | සුදුසු සැසඳුම් සකස් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇති අදාල උපදෙස් වලට අනුගත වීම අවශ්‍ය වේ. |
| (v) 2016 වර්ෂය සඳහා රු.9,362,691 ක් වූ ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බද්ද විගණිත දිනය දක්වා ගෙවා නොතිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අනුව සියලු අදාළ බදු ගෙවා ඇති අතර සමහර බදු තක්සේරු කිරීම්වලට එරෙහිව අභියාචනා ගොනු කර ඇත. ඒ අනුව අදාළ සියලු ගෙවිය යුතු බදු නිරවුල් කිරීමට බැංකුවට හැකිය. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත කිසිදු ප්‍රමාදයකින් තොරව සුදුසු අනුපාත අනුව බදු ප්‍රේෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. |

**1.7. නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) බැංකු පනතේ 2016 අංක 01 දරණ නියෝගය | 2018 දෙසැම්බර් 31 දිනට බැංකුව අවම මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය පවත්වා ගෙන ඇත. කෙසේ වෙතත්, පළමු, දෙවන හා තෙවන කාර්තු අවසානයේදී අවම මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයට අනුකූල නොවීම නිරීක්ෂණය විය. | BASEL III රෙගුලාසි වලට අනුව ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතාවය පවත්වා ගැනීම සඳහා බැංකුව විසින් නොයෙක් පියවර ගෙන ඇත. | නියාමන අවශ්‍යතාවයන්ට තදින් අනුකූල වීම සහතික කිරීම අවශ්‍ය වේ. |
| (ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමුව 2.1.1 සහ රාජ්‍ය මුදල් චක්‍රලේඛය පීඑෆ් /429 (i) | රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව බැංකුව විසින් සංවර්ධිත ප්‍රසම්පාදන අත්පොතක් භාවිතා කර ඇත . | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2006 හි 2.1.1 වගන්තියට අනුව, 2016 අප්‍රේල් 27 වන දින බැංකුව විසින් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යංශයේ ලේකම් හරහා ඉල්ලීමක් කර තිබුණි. 2018 ඔක්තෝබර් 27 දක්වා බැංකුව රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යංශය යටතේ පැමිණ තිබූ අතර, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධනය අමාත්‍යංශයේ ලේකම් විසින් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ මහලේකම්වරයා ගෙන් අනුමැතිය ඉල්ලා ඇත. | අදාල මාර්ගෝපදේශ පිළිපැදීමට අවශ්‍ය පියවර ගැනීම. |

## 1.8. පරිණත විශ්ලේෂණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම්වල එකඟ වූ කල්පිරීම් විශ්ලේෂණය කිරීමෙන් හෙළි වූයේ, මාස 3-12 සහ අවුරුදු 5 ට වැඩි මුළු මූල්‍ය වගකීම් මුළු මූල්‍ය වත්කම්වලට වඩා විශාල අතිරික්තයක් වූ අතර ද්‍රවශීලතා පරතරය පිළිවෙලින් රු.16,427,792,596 සහ රු.10,272,877,666 විය. | මුළු වත්කම් සහ වගකීම් අනුව බැංකුවේ පරිණත විශ්ලේෂණය පිළියෙළ කරන ලදි. කෙසේ වුවත් , බැංකුවේ ආයෝජන කළඹ තුළ ද්‍රවශීලතා අරමුණු සඳහා කෙටි කාලීන පරිණතීන් අඩංගු වේ. | බැංකුවේ අවදානම අවම කිරීම සඳහා මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම්හි එකඟ වූ කල් පිරීම් ගැලපීම අවශ්‍ය වේ. |

## 1.9. බදු රෙගුලාසි වලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 114 වන වගන්තිය හා 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 83 වන වගන්තියට (2018.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි), 2000 ජනවාරි 31 රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක පීඑෆ් / පීර් / 06 හා 2016 අප්‍රේල් 29 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී 03/2016 ට පටහැනිව, 2018 වර්ෂය සඳහා උපයන විට බදු ගෙවීම් ලෙස රු. 191, 479,007 ක මුදලක් අදාල සේවකයින්ගේ වැටුපෙන් අඩු කිරීමකින් තොරව බැංකුව සිය අරමුදල් වලින් එහි සේවකයන් වෙනුවෙන් ගෙවා තිබුණි. තවද, පීඊඩී චක්‍රලේඛ 03/2016 ට අනුකූලව උපයන විට බදු ගෙවීම් සේවක ඉපැයීම් වලින් අඩු කිරීමට නීතිපති සිය මතය ප්‍රකාශ කර තිබුණි. | ආර්ඩීබී පනතෙහි විධිවිධාන අනුව සේවකයින්ගේ උපයන විට ගෙවීමේ බදු වගකීම බැංකුව විසින් ගෙවා තිබූ අතර වෙනත් රාජ්‍ය බැංකු ද මෙම ආකාරයම අනුගමනය කරනු ලැබේ. තවද , දේශීය ආදායම් පනත මඟින් මෙය තහනම් ක්‍රියාවක් නොවේ. | අදාල මාර්ගෝපදේශ වලට අනුගත වීමට අවශ්‍ය පියවර ගන්න. |

| | | |
|---|---|---|
| (ii) 2006 අංක 13 දරණ ආර්ථික සේවා ගාස්තු පනත හා ඊට අදාල සංශෝධන අනුව, බැංකුවේ ඊඑස්සී (ESC) රු. 130,353,053 ක් විය. කෙසේ වෙතත්, බැංකුව විසින් 2018 වර්ෂය සඳහා ආර්ථික සේවා ගාස්තු ලෙස රු.129 ,248,353 ක් පමණක් ගෙවා ඇති අතර , එබැවින් ඊඑස්සී (ESC) වියදම රු. 1,104,700 කින් අඩුවෙන් දක්වා තිබුණි. | බැංකුව සෑම වසරකම මාර්තු 31 වන දිනෙන් අවසන් බදු තක්සේරු වර්ෂය සලකා ආර්ථික සේවා ගාස්තු ගෙවන අතර ඉහත වර්ෂය සඳහා බදු බැරද ලබා ගෙන ඇත. | අදාල මාර්ගෝපදේශ පිළිපැදීම හා වර්ෂය අවසානයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කිරීමට අවශ්‍ය පියවර ගැනීම. |
| (iii) 2018 වර්ෂය සඳහා බැංකුවේ බදු පසු ලාභය රු. 1,073,586,361 ක් වූ අතර, 2013 අංක 12 දරණ මුදල් පනතේ 14 වන වගන්තියට අනුව ඉහත ලාභය මත පදනම්ව වර්ෂය සඳහා භෝග රක්ෂණ බද්ද රු. 10,735,864 විය. රු.2,047,966 ක පෙර වර්ෂයේ ගැලපුම සමඟ, භෝග රක්ෂණ බද්දරු.12,783,830 ක් විය යුතුය. කෙසේ වෙතත්, පොදු ලෙජරයෙහි භෝග රක්ෂණ බදු වියදම රු. 10,332,117 ක් වීමෙන් රු. 2,451,713 කින් ලාභය වැඩියෙන් දැක්වීම හා එම ප්‍රමාණයෙන්ම වගකීම් අඩුවෙන් දැක්වීම නිරීක්ෂණය විය. | එකඟ වේ. 2013.08.23 වන දින ප්‍රකාශයට පත් කරන ලද රජයේ නිවේදන අංක 1824/23 අනුව, "වාර්ෂික ගිණුම් අවසන් කිරීමෙන් පසු පැන නගින අතිරේක වගකීම් තක්සේරු වර්ෂයේ සැප්තැම්බර් මස තිස් වන දිනට පෙර ගෙවිය යුතුය". එබැවින්, එම අතිරේක වගකීම සැප්තැම්බර් 30 හෝ ඊට පෙර ගෙවීමට අපේක්ෂා කෙරේ. | අදාල මාර්ගෝපදේශ පිළිපැදීම හා වර්ෂ අවසානයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කිරීමට අවශ්‍ය පියවර ගැනීම. |
| (iv) මූල්‍ය නොවන සේවා මත වැට් | | |
| (අ) 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත හා ඊට අදාල සංශෝධනයන්ට පටහැනිව, 2018 වර්ෂය සඳහා මූල්‍ය නොවන සේවා මත වැට් ගණනය කිරීමේදී 2018 ඔක්තෝබර් සිට 2018 දෙසැම්බර් දක්වා කාලය තුළ සැපයුම්කරුවන් සඳහා වූ රු. 750,010 ක වැට් මුදලක් වැට් බදු බැර සඳහා සලකා බලා නොතිබුණි. | එකඟ වේ. 2019 පෙබරවාරි මාසයේ ගෙවීම් කිරීමේදී එය සලකා බලන ලදී. | අදාල මාර්ගෝපදේශ පිළිපැදීම හා වර්ෂ අවසානයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කිරීමට අවශ්‍ය පියවර ගැනීම. |

| | | |
|---|---|---|
| (ආ) රු. 29,686,822 ක හර වටිනාකමක් 2012 සිට පොදු ලෙජරයෙහි ගෙවිය යුතු වැට් ගිණුමෙහි නිරවුල් කිරීමකින් තොරව පවතින බව නිරීක්ෂණය කරන ලදී. මේ හේතුවෙන් එම වටිනාකමින් වර්ෂයේ වගකීම් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම ශේෂය 2019 මැයි මස සිට මාස 8 ක් ඇතුළත කපා හැරීමට 2019 අප්‍රේල් 30 දින පැවති වත්කම් හා වගකීම් කමිටු රැස්වීමේදී තීරණය විය . | |
| (v) 2018 සඳහා මූල්‍ය සේවා මත වැට් ගණනය කිරීම.<br>2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනත හා එහි සංශෝධනයන්ට පටහැනිව; | | |
| (අ) ගමන් සහ යැපීම් ලෙස රු .55,768,289 ක මුදලක් වැට් බදු ගණනය කිරීම සඳහා සලකා නොතිබුණි. එම නිසා වර්ෂය සඳහා මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බද්ද රු. 6,860,215 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ගමන් සහ යැපුම් මුදලින් සේවකයින්ගේ නිල ගමන් සඳහා වන පිරිවැය ප්‍රතිපූරණය කිරීම නියෝජනය වන අතර එය පිරිස් පිරිවැය ලෙස නොසැලකේ. | ගමන් සහ යැපීම සත්‍ය බිල්පත් මත ප්‍රතිපූරණය කිරීමක් සිදු වී නොමැති බැවින් මූල්‍ය වැට් බදු ගණනය කිරීම සඳහා එය සලකා බැලිය යුතුය. |
| (ආ) ගෙවිය යුතු වැට් බදු මුදල වූ රු. 7,295,193 ක මුදල 2017 සිට විගණිත දිනය දක්වා ගෙවා නොතිබුණි. | ගෙවිය යුතු වැට් ගිණුමට ඇතුළත් කළ සියළු සටහන් පරීක්ෂා කිරීමෙන් පසු අවශ්‍ය සටහන් ඇතුළත් කෙරේ. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට කිසිදු ප්‍රමාදයකින් තොරව බදු ගෙවීමට අවශ්‍ය පියවර ගැනීම . |
| (vi) 2018 ආදායම් බදු.<br>2006 අංක 10 දරණ දේශීය ආදායම් පනත සහ එහි සංශෝධනයන්ට හා 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතට පටහැනිව, 2014 සිට 2018 දක්වා කාලය තුළ වටිනාකම රු.150,208,431 කට මිලදී ගත් වාහන ප්‍රාග්ධන දීමනා සඳහා සලකා බලන ලදී. ගමනාගමන අරමුණු සඳහා භාවිතා කරන වාහන සඳහා ප්‍රාග්ධන දීමනා ලබා ගත නොහැක. එබැවින් වාහන සඳහා රු. 136,920,626 ක ප්‍රාග්ධන දීමනා ලබා ගැනීම සඳහා හිමිකම් නොමැත. | මෙම වාහන බැංකුවෙහි ණය අයකර ගැනීම, තැන්පතු ප්‍රචාරණය වැනි මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගෙන ඇති බැවින් ආදායම් බදු ගණනය කිරීමේදී ප්‍රාග්ධන දීමනා ලබා ගෙන ඇත. | අදාල මාර්ගෝපදේශ පිළිපැදීමට අවශ්‍ය පියවර ගැනීම . |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2 ,103,081,891 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.2,190,725,745 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි, රු.87,643,854 හෙවත් සියයට 4 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ඉහළ පොලී පිරිවැය, ඉහළ පිරිස් වියදම් සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 9 හි බලපෑම හේතු විය.

### 2.2. ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ණය හා අත්තිකාරම් සඳහා පොලී ආදායම පෙර වසරට සාපේක්ෂව රු. මිලියන 3,474 කින් හෙවත් සියයට 20 කින් වැඩි වී ඇත. දළ ණය සහ අත්තිකාරම් පසුගිය වසරට සාපේක්ෂව රු. මිලියන 7,445 කින් හෙවත් සියයට 6 කින් වැඩි වීම ඊට ප්‍රධානතම හේතුව විය. පොලී අනුපාත සහ ආයෝජන කාලය ඉහළ යාම හේතුවෙන් තැන්පතු සඳහා පොලී ආදායම රු. මිලියන 411 කින් හෙවත් සියයට 492 කින් ඉහළ ගොස් තිබේ. පොලී වියදම සහ පිරිස් වියදම් පිළිවෙළින් රු. මිලියන 1, 689 කින් හෙවත් සියයට 16 කින් සහ රු.මිලියන 898 ක් හෙවත් සියයට 18 කින් වැඩි වී තිබේ. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 හි බලපෑම හේතුවෙන් හානිකරණ ගාස්තු රු. මිලියන 966 කින් හෙවත් සියයට 218 කින් වැඩි වී තිබුණි.

### 2.3. අනුපාත විශ්ලේෂණය

බැංකුවේ වැදගත් ගිණුම්කරණ අනුපාතයන් ආංශික අනුපාත හා සැසඳීමෙන් සමාලෝචිත වර්ෂය සඳහා පහත නිරීක්ෂණ කරනු ලැබේ .

(i) සියයට 3.25 ක් වූ බලපත්‍රලාභී විශේෂිත බැංකු අනුපාතයට සාපේක්ෂව 2018 වර්ෂයෙහි සියයට 6.88 ක ඉහළ ශුද්ධ පොලී ආන්තිකයක් නිරීක්ෂණය විය. සාමාන්‍ය බලපත්‍රලාභී බැංකු අනුපාතය වූ පිළිවෙලින් සියයට 11.52 ක් හා සියයට 8.27 ක් හා සැසඳීමේදී බැංකුව, සාමාන්‍ය වත්කම් වලින් සියයට 14.36 ක ඉහළ පොලී ආදායමක් සහ සාමාන්‍ය වත්කම්වලින් සියයට 7.49 ක් වූ පොලී වියදමක් වූ බව නිරීක්ෂණය විය. ගනුදෙනුකරුවන්ගෙන් ඉහළ පොලී අනුපාත අය කිරීම සහ පිරිවැය ඉහළ ස්ථාවර තැන්පතු මත යැපීම ඉහත කරුණු සඳහා ප්‍රධාන හේතු විය.

(ii) සියයට 54.2 ක් වූ ආංශික අනුපාතය හා සැසඳීමේදී 2018 වර්ෂයේ මෙහෙයුම් වියදම් සඳහා කාර්ය මණ්ඩල පිරිවැය සියයට 75.01 ක් විය.

(iii) දුර්වල ණය ඇගයීම්, අකාර්යක්ෂම සහ තිරසාර නොවන අයකිරීමේ ක්‍රියාමාර්ගයන් හේතුවෙන් පසුගිය වසර අවසානයේ සියයට 3.27 සිට 2018 දෙසැම්බර් 31 දිනට සියයට 5.40 දක්වා අක්‍රීය ණය අනුපාතයෙහි සැලකිය යුතු වැඩි වීමක් සමඟ වත්කම් වල ගුණාත්මකභාවයෙහි අහිතකර ප්‍රවණතාවයක් නිරීක්ෂණය විය. තවද, 2019 මැයි 31 වන විට බැංකුවේ අක්‍රීය ණය අනුපාතය සියයට 9.87 දක්වා වැඩි වී ඇත.

(iv) 2018 දෙසැම්බර් 31 දිනට වත්කම් මත ප්‍රතිලාභය සහ හිමිකම් මත ප්‍රතිලාභය පිළිවෙළින් සියයට 0.62 සහ සියයට 7.30 දක්වා අඩු වී තිබුණි. ඉහළ අක්‍රීය ණය අනුපාතය හේතුවෙන් හානිකරණ වියදම් සහ ඉහළ කාර්යමණ්ඩල පිරිවැය අඩු ලාභදායී මට්ටමකට හේතු වූ අතර ලකාපුත්‍ර සංවර්ධන බැංකුව සමඟ ඒකාබද්ධ වීම හිමිකම වැඩි කිරීම සඳහා දායක විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | කුරුවිට ශාඛා ගොඩනැගිල්ල මාස 9 ක් පමා කර කොන්ත්‍රාත්කරු විසින් බැංකුවට භාර දීම හේතුවෙන් 2018 වර්ෂය සඳහා රු.1,248,000 පිරිවැයකට කුලියට ගත් ගොඩනැගිල්ලක ශාඛාව පවත්වාගෙන ගොස් තිබූ අතර, 2017 දෙසැම්බර් 19 දින කුලී අත්තිකාරම් ලෙස ගෙවූ රු. 1,680,000 මුදල 2018 වර්ෂය සඳහා ආර්ථික නොවන ගනුදෙනුවකි. තවද, ගොඩනැගිල්ල භාරදීමේ ප්‍රමාද අලාභ අයකර ගැනීම පිළිබඳ කිසිදු වගන්තියක් බදු ගිවිසුමට ඇතුළත් කර නොතිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගොඩනැගිල්ල ඉදිරිපිට කාණු ඉදිකිරීම සහ එම ප්‍රදේශයට ගංවතුර තත්ත්වයක් ඇති වීම හේතුවෙන් මෙම ප්‍රමාදය සිදුවිය. | බැංකුවේ අරමුදල් කාර්යක්ෂමව භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගන්න. |
| (ii) | ඉමදුව ශාඛාව ඉදිකිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණද එය 2018 වසර අවසානය වන විටත් ඉදි කර නොතිබුණි. කෙසේ වෙතත්, රු.4,726,697 (බදු සමඟ) ක අත්තිකාරමක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණි. තවද, 2017 අප්‍රේල් 28 දින නෛතික ගාස්තු හා මුද්දර ගාස්තු ලෙස රු. 126,921 ක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණි. කෙසේ වෙතත්, කල්බදු ගිවිසුම විගණිත දිනය දක්වාත් නොතිබුණි. | ගැටළුව විසඳීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. | බැංකුවේ අරමුදල් කාර්යක්ෂමව භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගන්න. |

## 3.2. හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගන්දර සහ දෙවිනුවර ශාඛාවන්හි රන් භාණ්ඩ උකස් නිලධාරී ලෙස රාජකාරී කටයුතු කරන අතර තුර සේවකයෙකු විසින් රු.7,580,500 ක ප්‍රාග්ධන අලාභයක් සිදු කර තිබුණි. 2015 අගෝස්තු 03 දිනැති ආර්ඩීබී/එස්පී/අයිඑන්වී/ඒඑල්එස්/ජීඑම්/13/30 විනය නියෝගය අනුව 2013 අගෝස්තු 12 සිට ක්‍රියාත්මක වන පරිදි චූදිත සේවකයා සේවයෙන් ඉවත් කොට තිබුණි. කෙසේ වෙතත්, සිදු වූ පාඩුව අයකර ගැනීම පිළිබඳ ඉහත නියෝගයෙහි සඳහන් කර නොතිබුණි. | චූදිත සේවකයා සේවයෙන් පහ කර ඇගේ පාරිතෝෂිකය සහ බැංකු ශේෂය පාඩු පියවා ගැනීම සඳහා රඳවා ගෙන ඇත. රු .4 ,500,000 ක ප්‍රාග්ධන අලාභය රක්ෂණ වන්දි මුදලින් ද රු. 797,282 ක් රඳවාගත් පාරිතෝෂිකයෙන්ද රු.1,570,000 ක් සම්බන්ධ සේවකයන්ගේ රඳවා ගත් ඇති ප්‍රසාද දීමනා වලින් ද අයකර ගැනීමට පියවර ගෙන තිබේ. මෙම නඩුව රහස් පොලිසිය විසින් භාරගෙන ඇති අතර චූදිත සේවකයාට එරෙහිව නඩු පැවරීම සහ ඉතිරි මුදල චූදිත සේවකයාගෙන් අය කර ගත හැකි වනු ඇත. | චූදිත සේවකයා නිසා බැංකුවට සිදු වූ අලාභය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අදාල විනය නියෝගයෙහි සඳහන් කර නොතිබූ බැවින් බැංකුවට සිදුවූ අලාභය අය කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීම. |

## 3.3. කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) වෙළඳපළ පොලී අනුපාත අඩු වීමේ ප්‍රවණතාවයක් තුළ 2019 අප්‍රේල් 16, 17 හා 18 යන දිනවල විවෘත කළ ගිණුම් සඳහා සියයට 13.3 ක විශේෂ පොලී අනුපාතයක් ප්‍රදානය කිරීම මඟින් රු. බිලියන 3 (දළ වශයෙන්) තැන්පතු බැංකුව රැස් කර තිබුණි.<br>(ii) 2018 දෙසැම්බර් 31 දිනට මුළු පාරිභෝගික තැන්පතු වලින් සියයට 63.6 ක් ස්ථාවර තැන්පතු වලින් සමන්විත වූ අතර පාරිභෝගික තැන්පතු මත පොලී වියදමෙන් සියයට 80 වඩා වැඩි ප්‍රමාණයක් ස්ථාවර තැන්පතු මත පොලී වියදමෙහි ඇතුළත් වේ.එබැවින් වැඩි වශයෙන් | යහපත් ද්‍රවශීලතා අනුපාතයක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වන අතර බැංකුව විසින් ද්‍රවශීලතා අනුපාතය ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට වඩා ඉතා සුළු ප්‍රමාණයකින් පවත්වා ගෙන තිබූ අතර එය අතීතයේ දී ප්‍රබල ලෙස උච්චාවචනය විය. තවද, ද්‍රවශීලතාවය නොවෙනස්ව තබා ගැනීම සඳහා බැංකුව සැම විටම ස්ථාවර තැන්පතු සඳහා වෙළඳපල අනුපාතයට වඩා කුඩා ආන්තිකයක් තබා ගෙන තිබුණි. සිංහල සහ දෙමළ අලුත් අවුරුද්ද වෙනුවෙන් එනම්, 2019 අප්‍රේල් 16 දින අනුපාතයෙහි සුළු වැඩි කිරීමක් මඟින් තැන්පතු ප්‍රවර්ධනයක් කිරීමට වත්කම් හා වගකීම් කමිටුව තීරණය කරන ලදි. ප්‍රධාන වශයෙන් වසරක කල්පිරීමක් සහිත තැන්පතු වැඩියෙන් ආකර්ෂණය කර | වෙළඳපල ප්‍රවණතාවය සහ නියාමන අධිකාරිය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග විශ්ලේෂණය කිරීමෙන් බැංකු අරමුදල් කාර්යක්ෂමව භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගැනීම. |

| | | |
|---|---|---|
| ස්ථාවර තැන්පතු ආකර්ෂණය කර ගැනීමට පියවර ගැනීමෙන් ඉහළ පිරිවැයක් සහිත ස්ථාවර තැන්පතු මත රඳා පැවතීම තවදුරටත් ඉහළ යනු ඇත. | ගැනීමට සහ බැංකුවේ තැන්පතු පදනමට ධනාත්මක දායකත්වයක් ලබා ගත හැකි බැවින් ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරීවරුන්ගේ ඉල්ලීම් මත සතියේ ඉදිරි වැඩකරන දින දෙකක් දක්වා එය දීර්ඝ කරන ලදි. | |

**3.4. මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට රු.95,664,238ක වටිනාකමක් සහිත ස්ථාවර තැන්පතු මධ්‍යම බැංකු පද්ධතියට ඇතුළත් නොකර මැනුවල් ක්‍රමයට පවත්වා ගෙන තිබුණි. | කලින් පැවති ප්‍රාදේශීය බැංකු විසින් නිකුත් කර ඇති තැන්පතු මින් නියෝජනය වන අතර තොරතුරු ප්‍රමාණවත් නොවන බැවින් සීබීඑස් පද්ධතියට ඇතුළත් කිරීම අපහසු වී ඇත. තවද, මෙම තැන්පතු සහතික සඳහා තැන්පතු අවසන් කිරීම් හැර වෙනත් කිසිඳු ගනුදෙනුවක් නොමැත. | පද්ධතිය හරහා සියලුම ගනුදෙනු පවත්වා ගැනීමට අවශ්‍ය පියවර ගන්න. |

**3.5. මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2018 මැයි 01 දින සිට 2018 අගෝස්තු 31 දක්වා වූ කාලය තුළ සේවය කළ සභාපතිවරයා විසින්,<br>(අ) මාස හතරක කාලයක් සඳහා ලීටර් 680 ක (170X4) ඉන්ධන සඳහා හිමිකම් ලැබූ අතර ලීටර් 2,038.10 ක් භාවිතා කර ඇත . එබැවින්, පීර්ඩී චක්‍රලේඛවලට පටහැනිව ලීටර් 1358 ක් රු.183,250 (දළ වශයෙන්) වියදමින් භාවිතා කර ඇත .<br><br>(ආ) 2018 ජූලි සිට සැප්තැම්බර් දක්වා වූ මාස තුනක කාලය සඳහා රු. 73,250 ක මාසික කුලියකට නිවාසයක් ලබා දී තිබූ අතර ඉල්ලා අස්වීම හේතුවෙන් මාසයක් සඳහා වූ හිඟ කුලිය බැංකුව විසින් ගෙවා ඇත. | මේ සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ඉල්ලා 2018 ජූලි 05 දින බැංකුව විසින් ලිපියක් යවා ඇත . | කිසිදු අනුමත ලිපියක් ලැබී නොමැති බැවින් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පිළිපැදීමට අවශ්‍ය පියවර ගන්න. |

| | | |
|---|---|---|
| (ඇ) සභාපතිවරයාට ලබා දී ඇති දීමනා සහ වෙනත් පහසුකම් ගෙවීම සඳහා රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගෙන් අනුමැතිය ලබා ගන්නා ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය දැනුම් දී තිබේ. කෙසේ වෙතත්, එවැනි අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවීය. | | |
| (ii) 2016 ඔක්තෝබර් 25 දින කැබිනට් තීරණයට අනුව රු. මිලියන 500 ක අරමුදලකින් සවිය ණය යෝජනා ක්‍රමය වයඹ පළාතේ ක්‍රියාත්මක කරන ලදී. කෙසේ වෙතත්, ඉහත යෝජනා ක්‍රමය රජයේ බැංකු සමඟ ක්‍රියාත්මක කිරීමට වූ කැබිනට් තීරණයට පටහැනිව බැංකුව 2017 මාර්තු 10 වන දින වයඹ සංවර්ධන සමුපකාර සමිතිය සමඟ අතිරේක ගිවිසුමක් අත්සන් කර තිබුණි. තවද, ඉහත ගිවිසුම මඟින් සියයට 7 ක පොළී ආදායමෙන් 5 ක් ප්‍රේෂණය කිරීමට එකඟ වී ඇති අතර බැංකුව විසින් රාජ්‍ය සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ ජෙනරාල්ගේ 2016 නොවැම්බර් 25 දිනැති ලිපියට පටහැනිව 2019 මාර්තු 31 දක්වා වයඹ සංවර්ධන සමුපකාර සමිතියට රු.22,892,254 ක් ගෙවා ඇත. | අමාත්‍යාංශය සහ අදාළ සමිති අතර අදාළ අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ උපදෙස් අනුව ගිවිසුම අත්සන් කර ඇත. මේ සම්බන්ධයෙන් කැබිනට් තීරණය අප වෙත තවම දැනුම් දී නොමැති නමුත් ගිවිසුම් දෙකක් සඳහා අමාත්‍යවරයාගේ නිලධාරීන්ගේ අනුකූලතාවය ලබා දී ඇත. මීට අමතරව, අප සමඟ ගිවිසුමට අත්සන් කළ අමාත්‍යවරයා සියයට 7 න් සියයට 5 ක පොළී අනුපාතයක් සමුපකාරයට ලබා දෙන ලෙස උපදෙස් දෙන ලදි. | කැබිනට් තීරණ හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ වලට අනුකූලව ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීම. |

**3.6. ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2016 නොවැම්බර් 24 වන දින රු. 1,550,000 ක වටිනාකමක් වූ තොග පාලන පද්ධතියක් සැපයීම, ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම සඳහා ඒබීසී කම්පියුටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් සමඟ බැංකුව ගිවිසුමක් අත්සන් කර තිබුණි. ගිවිසුම් කොන්දේසි අංක 04 හා | ගිවිසුම හා එකඟ වූ ගෙවීම් නියමයන්ට අනුව බැංකුව විසින් UAT (පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණ) දක්වා ගෙවීම් සිදු කර ඇති අතර පද්ධතිය දැනට සජීවීව ක්‍රියාත්මක වේ. දෝශ නිරාකරණය සඳහා සමාගමේ සහාය අපේක්ෂා කළ මට්ටමේ නොතිබූ බැවින් ඉතිරි ගෙවීම අත්හිටුවා ඇත. සජීවී ධාවනය | බැංකුවේ තොග පාලන පද්ධතියේ මෘදුකාංග සංවර්ධනය සඳහා ගිවිසුම අත්සන් කර තිබුණි. කෙසේ වෙතත්, බැංකුව විසින් පරිගණක අයිතම සම්බන්ධයෙන් පමණක් පද්ධතිය සජීවීව ක්‍රියාත්මක කරයි. එබැවින් අත්සන් කරන ලද ගිවිසුමට අනුව කිසිදු ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘතිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘතියෙහි සැලසුම් ගත කාලය අනුව, වැඩ කරන දින 81 ක් තුළ සියළු අදියර සම්පූර්ණ කිරීමෙන් ඉහත ව්‍යාපෘතිය 2016 දෙසැම්බර් 16 දින හෝ ඊට පෙර අවසන් කළ යුතුය. වටිනාකම රු. 930,000 ක් වූ අත්තිකාරම් තුනක් ගෙවා තිබුණද එය 2019 මාර්තු 06 වන විගණිත දිනය වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. | සඳහා ගෙවිය යුතු ගෙවීම් තවමත් සිදු කර නැත. බැංකුවෙහි අරමුණු සඳහා පද්ධතිය සජීවීව ධාවනය කරන බැවින් ප්‍රමාදයක් නොමැත. කෙසේ වෙතත්, සමාගම එකඟ වූ කාල සීමාව තුළ අවසන් කිරීමට හා තාක්ෂණික ප්‍රමිතීන්ට අනුකූලව සම්පූර්ණ කර භාර දිය යුතුය. | |
| (ii) | 2015 දෙසැම්බර් 17 වන දින රු. 11,250,000 ක වටිනාකමින් යුතු මානව සම්පත් කළමනාකරණ පද්ධතියේ මෘදුකාංග සංවර්ධනය සඳහා මයික්‍රෝ්ඉමේජ් ප්‍රයිවට් ලිමිටඩ් සමඟ බැංකුව ගිවිසුමක් අත්සන් කර ඇත. ගිවිසුම් කොන්දේසි අංක 10.3 හා ව්‍යාපෘතියෙහි සැලසුම් ගත කාලය අනුව සම්පූර්ණ ව්‍යාපෘතිය 2016 නොවැම්බර් 30 දින නිම කළ යුතුය. අත්තිකාරම් එකොළහක වටිනාකම වූ රු.6,208,672 ක මුදලක් හෙවත් මුළු ව්‍යාපෘති වටිනාකමින් සියයට 55.19 ක් ගෙවූවද 2019 මාර්තු 06 වන විගණිත දිනය වන විටත් එය සම්පූර්ණ කර නොතිබූ බවත් මාස 27 ක ප්‍රමාදයක් ඇති බවත් නිරීක්ෂණය විය. | ආර්ඩීබී හි අවශ්‍යතා වලට අනුකූල වන පරිදි සකස්කිරීම සඳහා කාලය ගතවන බැවින් කලින් එකඟ වූ කාලරාමුව යථාර්ථවාදී නොවේ. එහි ප්‍රතිඵලයක් ලෙස බැංකුවෙන් සහ සැපයුම්කරුගන් ලබා දෙන සම්පත් සහාය සැලකිල්ලට ගනිමින් වරින් වර මොඩියුල ලබා දීම සඳහා බැංකුව සැපයුම්කරු සමඟ එකඟ විය. මේ වන විට මොඩියුල 5 ක් සජීවීව ක්‍රියාත්මක වන අතර අනෙක් මොඩියුල 4 එකඟ වූ කාල සීමාව තුළ සජීවීව ක්‍රියාත්මක කිරීමට සූදානම් වේ. වැඩ වේගවත් කිරීම සඳහා ව්‍යාපෘති කණ්ඩායමට ලබා දී ඇති කාර්ය භාරය ඉවත් කරමින් දැනටමත් සජීවීව ක්‍රියාත්මක වන මොඩියුලවල වැඩ කටයුතු කරගෙන යාම සඳහා මානව සම්පත් කාර්ය මණ්ඩලය අතර වගකීම් පැවරීමට දැනටමත් පියවර ගෙන ඇත. දෝශ නිරාකරණයේ ප්‍රගතිය නිරන්තරයෙන් නිරීක්ෂණය කිරීමට ද පියවර ගෙන ඇත. | එකඟ වූ පරිදි ව්‍යාපෘතිය නිම කර නොමැති බැවින් ව්‍යාපෘතිය ප්‍රමාදයකින් තොරව නිම කිරීමට අවශ්‍ය පියවර ගන්න. |

### 3.7. ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 පෙබරවාරි 26 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවට අනුව ප්‍රසම්පාදන අංක ඩීජීඑම්/එච්ආර්/ආර්ඩීබී/2018/ 002 සඳහා අවම ලංසුකරු නිර්දේශ කර තිබුණු අතර 2018 මාර්තු 05 දිනැති විධායක ප්‍රසම්පාදන කමිටු රැස්වීමේ උපදෙස් පරිදි තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඉහත ටෙන්ඩරය නැවත ඇගයීමට ලක් කර සාධාරණ හේතුවකින් තොරව අඩුම ලංසුකරු ප්‍රතික්ෂේප කර දෙවන අඩුම ලංසුකරු තෝරාගෙන තිබුණි. | ලංසු පළමු ඇගයීමේ අදියරේදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අඩුම ලංසුකරු තෝරාගෙන තිබුණි. තොරාගත් ලංසුකරුගේ සැලකියයුතු ප්‍රතිචාර දැක්වීම මත නැවත සලකා බැලීමට ප්‍රසම්පාදන කමිටුව විසින් උපදෙස් දී තිබුණු අතර තාක්ෂණික ඇගයීම් කමිටුව තෝරාගත් අවම ලංසුකරුගේ පැහැදිලි කිරීම් කරන වාර්තාවක් ලබාගෙන තිබුණි. ලංසු කොන්දේසි අනුව පිරිසිදු කිරීමේ සේවාව පිළිබඳව තෝරාගත් ලංසුකරු විසින් සියළුම යෙදවුම් හා උපකරණ සැපයිය යුතු වුවත් මාසය පුරාම පිරිසිදු කිරීමේ සේවාව පවත්වාගෙන යෑමට මිලගණන් ඉදිරිපත් කරන ලද අවම ලංසුකරු ප්‍රමාණවත් නොවේ. මූල්‍ය අංශය තුළ පෙර අත්දැකීම් අනුව අඩුම ලංසුකරු ප්‍රතික්ෂේප කිරීමට ප්‍රධාන හේතුවක් නොවූ අතර බැංකු අවශ්‍යතා සමඟ සසඳන විට ඉහත අඩුම ලංසුව ඉදිරිපත් කරනු ලැබූ ලංසුකරු ටෙන්ඩර් සඳහා සැලකිය යුතු ප්‍රතිචාරයක් දක්වා නොමැති විය. | විධායක ප්‍රසම්පාදන රැස්වීමේ සටහන් අනුව, තෝරාගත් ලංසුකරුට මූල්‍ය අංශයේ ආයතනවල පෙර අත්දැකීම් නොමැති බව ප්‍රසම්පාදන කමිටුවේ අදහස වූ අතර සේවා මට්ටම සහ සියලු ලංසුකරුවන්ගේ මිල ගණන් නැවත සලකා බැලීමට යෝජනා කරන ලදී. එබැවින්, සාධාරණ හේතුවකින් තොරව අඩුම ලංසුකරු ප්‍රතික්ෂේප කිරීම සහ දෙවන අඩුම ලංසුකරු තෝරා ගැනීම විගණනයට ගැටළු සහගත වන අතර විනිවිද පෙනෙන ක්‍රියා පටිපාටියක් ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී බැංකුව විසින් ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.8. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරී තනතුර සඳහා නිලධාරීන් දෙදෙනෙකු උසස් කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ. | | |

| | | | |
|---|---|---|---|
| (i) | 2017 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරී හා ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී තනතුරු වල බැංකුවේ අනුමත කාර්‍ය මණ්ඩලය 12 කි. කෙසේ වෙතත්, සත්‍ය කාර්‍ය මණ්ඩලය 13 බව නිරීක්ෂණය විය. | 2017 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරී හා ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී තනතුරු වල බැංකුවේ අනුමත කාර්‍ය මණ්ඩලය 12 කි. කෙසේ වෙතත්, එදිනට නිලධාරීන් 13 දෙනෙකු තනතුර දැරූ අතර දැනට එය නිවැරදි කර ඇත. | අනුමත සේවක සංඛ්‍යාව මත පදනම්ව පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. |
| (ii) | ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ සඳහන් කර ඇති ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරීගේ සුදුසුකම් වලට ගැලපීම සඳහා යයි සඳහන් කරමින් අයදුම්පත් කැඳවීමෙන් පසු ද ඉහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් වෙනස් කර තිබුණි.<br>වරින් වර අවශ්‍ය සුදුසුකම් වෙනස් කිරීමෙන්, සමහර නිලධාරීන්ට හට වාසියකුත් වෙනත් අයකුට අවාසියකුත් ඇති විය හැකිය. | අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා 2018/1590 ඉදිරිපත් කරමින් ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරීගේ/ ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරීගේ තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් වෙනස් කර ඇත.<br>බැංකු පනතේ විධිවිධානවලට අනුකූල වීම සඳහා සුදුසුකම් සංශෝධනය කර ඇත. | සේවකයින් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ දී විනිවිද පෙනෙන ක්‍රියා පටිපාටියක් අනුගමනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම. |
| (iii) | 2018 පෙබරවාරි 16 දිනැති කාර්යාල උපදෙස් චක්‍රලේඛ පරිපාලන අංක 2018/108 හි කොන්දේසි අංක 2.3 පරිදි පසුගිය වසර 5 ක වැටුප් වර්ධක සම්පූර්ණ කර නොතිබූ, උසස් කිරීම් සඳහා සලකා නොබලන ලෙස විනය නියෝගයක් නිකුත් කර තිබූ නිලධාරියෙකු ඉහළ තනතුරක් සඳහා උසස් කර තිබුණි. | කළමනාකාරිත්වය අදාළ නිලධාරියාගේ කාර්යසාධනය තක්සේරු කළ අතර 2014 වර්ෂය සඳහා වැටුප් වර්ධකය හැරෙන්නට සිද්ධියේ දින සිට ඇයට වැටුප් වර්ධක ලබා දී ඇත. සංශෝධිත විනය නියෝගයට අනුව 2011 වර්ෂයේ වැටුප් වර්ධකය අත්හිටුවිය යුතු අතර එය 2014 වර්ෂය සඳහා වැටුප් වර්ධකයක් නොවේ . මෙය සිදු කිරීම ප්‍රමාද වූයේ 2014 දී විනය නියෝගය නිකුත් කිරීම හේතුවෙනි. | සමහර සේවකයින්ට වාසියක් හෝ අවාසියක් නොමැතිව විනය නියෝග නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1. සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂය අවසානයේදී, සංයුක්ත සැලැස්මේ දක්වා ඇති පරිදි බැංකුවේ තත්‍ය කාර්යසාධනය ප්‍රක්ෂේපිත ව්‍යාපාරික අරමුණු ඉක්මවා ගොස් තිබුණි. එබැවින්, 2018 මාර්තු 27 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 2018/1616 අනුව සංයුක්ත සැලැස්ම සංශෝධනය කර ඇත. කෙසේ වෙතත්, පවතින සංයුක්ත සැලසුමේ පුරෝකථනයන් 2020 වර්ෂය දක්වා පමණි. | 2020 න් ඔබ්බට වසර 5 ක් සඳහා නව සංයුක්ත සැලැස්මක් සංවර්ධනය කෙරේ. | කිසිදු ප්‍රමාදයකින් තොරව සංයුක්ත සැලැස්ම සකස් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම . |